# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 ඔක්තෝබර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 2.00 යි තැපැල් ගාස්තුව : රු. 1.50 යි

# 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 68/80.

**පාරම්පරික හස්ත කර්මාන්ත ඇතුළු හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ, සංවර්ධනය කිරීමේ සහ පෝෂණය කිරීමේ කාර්යය සඳහා ද ඒවායේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ද ජාතික ශිල්ප සභාව, ශිල්ප සභා, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ වෙන් වෙන් කොටස් ක්‍රියාත්මකවීම සඳහා වෙන් වෙන් දින අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. *(කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

## I වන කොටස

2. (1) (මින් මතු මේ කොටසෙහි "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ශිල්ප සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. *(ජාතික ශිල්ප සභාව පිහිටුවීම.)*

(2) සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද එහි සංස්ථා නාමයෙන් සභාව විසින් නඩු පැවරීම සහ සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන— *(සභාවේ සංයුතිය.)*

(i) 25 වන වගන්තිය යටතේ පත් කරන ලද ශිල්ප සභා හෝ යම් ශිල්පයක් හෝ ශිල්ප නියෝජනය කිරීම සඳහා තැනැත්තන් පස්දෙනකුට නොවැඩි මුළු සාමාජික සංඛ්‍යාවකගෙන් ;

(ii) අමාත්‍යවරයාගේ මතය පරිදි සභාවේ කටයුතුවලට අදාළ වන්නා වූ විශේෂ සුදුසුකම්ලත් පුද්ගලයන් තිදෙනකු ගෙන් ;

(iii) ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහු විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයකුගෙන් ;

(iv) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් පුද්ගලයකුගෙන් ;

(v) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් පුද්ගලයකුගෙන් ;

(vi) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ;

2—ඒ 63853—12,225 (82/06)

(vii) ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සභාපතිවරයාගෙන් ;

(viii) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් ; සහ

(ix) ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයාගෙන් හෝ ඔහු විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන්

සභාව සමන්විත විය යුතු ය.

(2) සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකත්වයට නුසුදුසුවීම.

4. තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් නැතහොත් මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) සභාවේ සාමාජිකයකු වශයෙන් තමාගේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අගතිකර ලෙස බල පෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්

ඔහු සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීම සඳහා හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

5. (1) පත් කරන ලද සෑම සාමාජිකයකු ම, තමා මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) සභාවේ යම් සාමාජිකයකු මියගිය හෝ ධුරය හැරගිය හෝ ඔහු ධුරයෙන් ඉවත් කරන ලද අවස්ථාවක අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සභාවේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙහි කාර්ය යම් කාලසීමාවක් තුළ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයටම වෙනත් තැනැත්තකු ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම පිණිස පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ මුද්‍රාව.

6. (1) සභාවේ මුද්‍රාව සභාව භාරයේ තිබිය යුතු ය.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට සභාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන් ඉවත් කිරීම.

7. (1) 3 වන වගන්තිය යටතේ පත් කරන ලද සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරතහොත් ඒ සඳහා හේතු සඳහන් නොකර ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම.

8. ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් ඕනෑම අවස්ථාවක සභාවේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

සභාවේ සාමාජිකයන්ගේ වියදම් ප්‍රතිපූරණය කිරීම.

9. සභාවේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතු නමුත් සභාවේ රැස්වීම්වලට පැමිණීමේ කාර්යය සඳහා හෝ සභාවේ කටයුතු සම්බන්ධයෙන් වූ වෙනත් එවැනි කාර්ය සඳහා ඔවුන් විසින් දරනු ලබන ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ ආනුෂංගික වියදම් සභාව විසින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්.

10. (1) සභාව අවම වශයෙන් සෑම තුන් මසකට වරක්වත් රැස්විය යුතු ය.

(2) සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු සභාවේ සියලු ම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් සාමාජිකයන්ගෙන් කෙනකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(3) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියමිත පරිදි විය යුතු ය.

පුරප්පාඩුවක් හෝ සාමාජිකයන්ගේ පත්වීමෙහි දෝෂයක් හේතුකොට ගෙන ක්‍රියා අවලංගු නොවන බව.

11. සභාවේ යම් පුරප්පාඩුවක් හෝ සභාවේ යම් සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

ස්ථාවර කමිටු.

12. (1) සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් සභාවේ කාර්තව්‍ය ඉටුකිරීමෙහි ලා සහායවීම පිණිස අවශ්‍ය වන්නේ යයි ඔහු විසින් සලකනු ලබන ස්ථාවර කමිටු පත් කරනු ලැබිය හැකි අතර ඒ කමිටුවල සාමාජිකයන් වීමට සුදුසු යයි ඔහු විසින් සලකනු ලබන (සභාවට සම්බන්ධ වූ හෝ නොවූ හෝ) තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ස්ථාවර කමිටුවක සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් ඒ කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය. එසේ පත් කරන ලද සභාපතිවරයා එම කමිටුව කැඳවන්නා විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සෑම ස්ථාවර කමිටුවක් ම ඒ කමිටුවේ රැස්වීම් සඳහා ගණපූරණය තීරණය කළ යුතු ය.

(4) ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියමිත පරිදි විය යුතු ය.

බලතල පැවරීම.

**13.** (1) සභාවේ බලතල සහ කර්තව්‍ය අතුරින් කිසිවක් සභාව විසින් ස්ථාවර කමිටුවකට පවරා දෙනු ලැබිය හැකි ය.

(2) පවරා දෙන ලද පරිදි බලතල සහ කර්තව්‍ය, සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ස්ථාවර කමිටුවක් විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සභාවේ ලේකම්වරයා.

**14.** සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ප්‍රවීන සහ පළපුරුදු තැනැත්තකු ඒ සභාවේ ලේකම්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

කාර්ය මණ්ඩලය පිළිබඳව සභාව සතු බලතල.

**15.** මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව—

(අ) සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) කාර්ය මණ්ඩලයේ වැටුප් හෝ වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ සේවා කොන්දේසි තීරණය කිරීම; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදලක් සහ ක්‍රම පිහිටුවා විධිමත් කිරීම ද ඒ අරමුදලට හෝ ක්‍රමවලට දායක මුදල් ගෙවීම ද

සභාව විසින් කරනු ලැබිය හැකි ය.

කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**16.** (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩල යට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩල යට ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් සභාව යටතේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජික යකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවක යකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සම්බන්ධ යෙන් වූ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව සභාව සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එම පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලබන නියම සහ කොන්දේසි මත, සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(6) සභාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සම්බන්ධ යෙන් වූ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව සභාව සහ එකී රාජ්‍ය සංස්ථාව විසින් එකඟවනු ලබන නියම සහ කොන්දේසි මත සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(7) සභාවේ කාර්ය මණ්ඩලයට (5) වන හෝ (6) වන උපවගන්ති ප්‍රකාර යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලද අවස්ථාවක දී, ඒ තැනැත්තා, සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් විය යුතු විනය පාලනයට ම යටත් විය යුතු ය.

සභාවේ බලතල සහ කර්තව්‍ය.

**17.** සභාවේ බලතල සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවේ සහ විදේශවල ප්‍රදර්ශන පැවැත්වීම;

(ආ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා වූ අමු ද්‍රව්‍යවල හා නිමි භාණ්ඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) හස්ත කර්මාන්තය අධ්‍යයනය කිරීම සඳහා ත්‍යාග, පදක්කම් සහ ශිෂ්‍යත්ව ඇති කර ප්‍රදානය කිරීම;

(ඈ) හස්ත කර්මාන්ත භාණ්ඩ මෝස්තර කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ යෙදී සිටින්නා වූ ශිල්ප සභා හෝ වෙනත් ආයතන හෝ සංවිධානවලට අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මූල්‍ය සහ වෙනත් යම් ආධාර සැපයීම;

(ඉ) ශිල්පීන් පුහුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ශිල්පීන් හා ආධුනිකයන් සඳහා සියලු වැඩ සටහන් පිළිබඳව සහ ශිල්පීන් සමග සම්බන්ධතා ඇති පුහුණුවීමේ ආයතන භාර සේවා නියුක්තයන්ට උපදෙස් දීම;

(ඊ) ශිල්පීන්ගේ සුභසාධනය සඳහා යෝජනා ක්‍රම ආරම්භ කිරීම;

(උ) ශිල්පීන් සඳහා ජාත්‍යන්තර හුවමාරු කර ගැනීමේ වැඩ සටහන් ආරම්භ කිරීම;

(ඌ) ශිල්පීන්ගේ තත්ත්වයන් සහ දක්ෂතා දියුණු කිරීම පිණිස පාරම්පරික, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ වැඩ මුළු සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;

(එ) ශිල්පවලට අදාළ තොරතුරු සහ දැනුම පැතිරවීම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ඒ) පාරම්පරික, ජාතික හෝ සංස්කෘතික වටිනාකමකින් යුත් හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීම පිළිබඳ උපදෙස් දීම සහ ඒ හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ශිල්ප කෞතුකාගාර සහ චිත්‍රාගාර පිහිටුවීම.

සභාවේ අරමුදල.

**18.** (1) සභාවට සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය. සභාවේ අරමුදලට—

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව මගින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්;

(ඇ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතන විසින් නීතියට අනුකූලව සභාවට පවරනු ලබන සියලු මුදල්; සහ

(ඈ) හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීමෙහි ලා මේ කොටස යටතේ පනවන ලද සියලු සෙස් බදුවලින් ලත් මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී සභාව විසින් දරන ලද යම් වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීම සඳහා සෙස් බද්ද පැනවීම.

19. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ සහ වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින්, කලින් කල තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව සෙස් බද්දක්, ඒ නියමයේ සඳහන් කරනු ලබන හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීමේ දී ඒ සඳහා අය කිරීම, ලබා ගැනීම සහ ගෙවීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද සෙස් බදු මුදල එවැනිම නියමයක් මගින් වෙනස් කරනු ලැබීම හෝ පරිවර්තනය කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය. එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් එම අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට වූ ලෙස සැලකිය යුතු ය. නමුත් ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැති විය යුතු ය.

(4) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වුවාක් මෙන් බලපැවැත්විය යුතු අතර, එම ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ අයකර ගන්නා ලද සෙස් බදුවලින් ලත් මුදල් ප්‍රධාන රේගු අයකැමි විසින් මාස්පතා සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද යම් අපනයන බද්දකට හෝ වෙනත් යම් සෙස් බද්දකට අතිරේකව විය යුතු ය.

සභාවේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

20. (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින්, සභාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු කටයුතු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සභාවේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

21. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව, සහ එහි කාර්ය සඳහා සභාවේ සියලුම නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

22. සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

වාර්තා සහ තොරතුරු.

23. (1) මේ කොටස යටතේ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට සභාවට හැකි කිරීමේ කාර්යය සඳහා, සභාව විසින් හෝ සභාව විසින් ඒ කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත සභාවට හෝ බලය ලත් තැනැත්තාට ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරන ලද සියලු වාර්තා සහ තොරතුරු සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට නියම කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද, යම් නීතියක විධිවිධාන යටතේ ඒ වාර්තාව කිරීමෙන් හෝ ඒ තොරතුරු අනාවරණය කිරීමෙන් ඒ තැනැත්තා නතර කරනු ලැබූ අවස්ථාවක හැර, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

නියෝග.

24. (1) මේ කොටස මගින් නියම කරනු ලැබීමට අවශ්‍ය කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

ශිල්ප සභාවල සංයුතිය.

25. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින්, එම නියමයෙහි සඳහන් කරනු ලබන ශිල්පයක් හෝ ශිල්ප සමූහයක් සම්බන්ධයෙන් (මෙහි මින් මතු "සභාවක්" යනුවෙන් හඳුන්වනු ලබන) එක් ශිල්ප සභාවක් හෝ ඊට වැඩි ශිල්ප සභා සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සභාවට පත් කරනු ලබන හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහ දැනුමක් ලබා ගෙන ඇති පුද්ගලයන්ගෙන් හෝ රජයේ ධුර දරන්නන් වීම නිසා ඒ සභාවේ කටයුතුවලට අදාළ වන්නා වූ විශේෂ සුදුසුකම් ලබා ඇති පුද්ගලයන්ගෙන් පස් දෙනකුට නොඅඩු වන්නා වූ සහ දහ දෙනකුට නොවැඩි වන්නා වූ පුද්ගලයන්ගෙන් ඒ සභාව සමන්විත විය යුතු ය.

(3) ඒ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු එම සභාවේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකත්වයට නුසුදුසු වීම.

26. තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් හෝ මන්ත්‍රීවරයෙක් වුවහොත්; හෝ

(ආ) සභාවක සාමාජිකයකු වශයෙන් තමාගේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අහිතකර ලෙස බල පෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්,

ඔහු සභාවක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ සභාවක සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීම සඳහා හෝ සුදුස්සකු නොවිය යුතු ය.

සාමාජිකයින්ගේ ධුර කාලය.

27. (1) සෑම සාමාජිකයකු ම තමා මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) සභාවක යම් සාමාජිකයකු මියගිය හෝ ධුරය හැර ගිය හෝ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 25 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජික ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්ය යම් කාල සීමාවක් තුළ ඉටු කිරීමට සභාවක යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 25 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම වෙනත් තැනැත්තකු ඒ කාලය තුළ ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම පිණිස පත් කරනු ලැබිය හැකි ය.

සභාවක රැස්වීම.

28. සභාවක රැස්වීම් සහ ඒ රැස්වීම් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ද ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද මේ කොටස යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

සභාවක සාමාජිකයන් ඉවත් කිරීම.

29. (1) 25 වන වගන්තිය යටතේ පත් කරන ලද සභාවක යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරතහොත් ඒ සඳහා හේතු සඳහන් නොකර ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සාමාජිකයන් ගේ ඉල්ලා අස්වීම.

30. ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් ඕනෑම අවස්ථාවක සභාවක යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

සභාවක බලතල සහ කර්තව්‍ය.

31. සභාවක බලතල සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) හස්ත කර්මාන්ත භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම සහ සහාය වීම ;

(ආ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම සහ නිමි භාණ්ඩවල තත්ත්වය සහ ප්‍රමිති වැඩිදියුණු කිරීම ;

(ඇ) ශිල්පීන් පුහුණු කිරීමේ කාර්යය සඳහා මධ්‍යස්ථාන, වැඩ පොළවල් සහ වෙනත් ආයතන පිහිටුවීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම.

නියෝග.

32. (1) මේ කොටස මගින් නියම කරනු ලැබීමට අවශ්‍ය කරන ලද්දා වූ කාරණා සම්බන්ධයෙන් සහ විශේෂයෙන් ම පහත දැක් වෙන කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) සභාවක සාමාජිකත්වය සඳහා අපේක්ෂකයන් තෝරා ගැනී මේ ක්‍රමය සහ ආකාරය ;

(ආ) සභාවක කටයුතු පවත්වා ගෙන යාම සඳහා කාර්ය පරිපාටිය ; සහ

(ඇ) සභාවක ගිණුම් සහ මුදල් කටයුතු පිළිබඳ කාර්ය පරිපාටිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

33. (1) (මෙහි මින් මතු මේ කොටසෙහි "මණ්ඩලය" යනු වෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම ද මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

34. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන— මණ්ඩලයේ සාමාජිකයෝ.

(අ) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද සහ දැනීම ලබා ගෙන ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන පුද්ගලයන් අතුරින් සාමාජිකයන් පස් දෙනකුගෙන් ;

(ආ) වෙළෙඳ විෂයය පවරන ලද අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් ; හා

(ඇ) මුදල් විෂයය පවරන ලද අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන්

මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සාමාජිකයන්ගෙන් එක් අයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු අතර ඒ විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

35. (1) පහත දැක්වෙන තැනැත්තන් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීම සඳහා හෝ සුදුස්සකු නොවිය යුතු ය:— සාමාජිකත්වයට නුසුදුසු වීම.

(අ) ඔහු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් හෝ මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තමාගේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අගතිකර ලෙස බල පෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්, අමාත්‍යවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලබන සෑම සාමාජිකයකු සම්බන්ධයෙන් ම ඒ සාමාජිකයාට එවැනි සම්බන්ධතා නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත් විය යුතු ය.

(2) මණ්ඩලය විසින් එළඹි ඇති හෝ එළඹීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඒ සම්බන්ධතාවයේ

ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී එළිදරව් කළ යුතුය. ඒ එළිදරව් කිරීම මණ්ඩලයේ වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු අතර එම ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් විචාරණයකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

36. (1) සෑම සාමාජිකයකු ම තමා මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර; නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු මියගිය හෝ ධුරය හැර ගිය හෝ ඔහු ධුරයෙන් ඉවත් කරන ලද අවස්ථාවක හෝ අමාත්‍යවරයා විසින් 34 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයටම වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි ව ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් කාලසීමාවක දී ස්වකීය ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 34 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම වෙනත් තැනැත්තකු ඒ කාලය තුළ ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම පිණිස පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන් ඉවත් කිරීම.

37. (1) 34 වන වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරත හොත් ඒ සඳහා හේතු සඳහන් නොකර ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම.

38. ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

39. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් මණ්ඩලයේ අරමුදලින් සියලු ම සාමාජිකයන්ට හෝ ඔවුන් අතුරින් යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම් සහ ගණපූරණය.

40. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් සාමාජිකයන්ගෙන් කෙනකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා තෝරා පත් කළ යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය නියමිත පරිදි විය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් ඇති වුවහොත් ඒ රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම මාස දෙකකට වරක් රැස් විය යුතු ය.

41. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම හෝ හේතු කොටගෙන පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බලරහිත වූ ලෙස සලකනු නොලැබිය යුතු ය. සාමාජිකයකු පිළිබඳව පුරප්පාඩුවක් හෝ පත් කිරීමේ දෝෂයක් හේතුකොටගෙන ක්‍රියා නිෂ්බල නොවිය යුතු බව.

42. (1) සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයෙහි ඔහුගේ සාමාජිකත්වයේ කාලසීමාව විය යුතු ය. සභාපතිවරයාගේ ධුර කාලය.

(2) සභාපතිවරයාට අමාත්‍යවරයා වෙත යැවෙන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් කලින් ඉල්ලා අස් විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, ඕනෑම විටක සභාපතිවරයාගේ පත් වීම හේතු නොදක්වා අවසන් කිරීම කරනු ලැබිය හැකි අතර ඒ අවසන් කිරීම ගැන යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

43. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු ය. මණ්ඩලයේ මුද්‍රාව.

(2) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මණ්ඩලයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය.

44. මණ්ඩලයේ පරමාර්ථ :— මණ්ඩලයේ පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම හා ඒවායේ තත්ත්වය දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ සහ විදේශවල විකිණීම සහ අලෙවි කිරීම ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඇ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි ලා අවශ්‍ය යයි මණ්ඩලයේ මතය වනු ලබන සියලු ක්‍රියා කිරීම

විය යුතු ය.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

45. (අ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස මෝස්තර නිර්මාණය කිරීමෙහි හෝ යොදා ගැනීමේ කාර්යය සඳහා මධ්‍යස්ථාන, වැඩපළවල් හෝ වෙනත් ආයතන පිහිටුවීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම ද ඒවා පිහිටුවීමට, නඩත්තු කිරීමට සහ මෙහෙයවීමට සහාය වීම ද ඒ මධ්‍යස්ථානවල, වැඩපළවල හෝ වෙනත් ආයතනවල නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවි කිරීම ;

(ආ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ යන්ත්‍ර, උපකරණ සහ අමු ද්‍රව්‍ය සැපයීම ;

(ඇ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබාගැනීම, සැපයීම සහ බෙදා හැරීම ;

(ඈ) ශිල්පීන්ට අවශ්‍ය විය හැකි මධ්‍යකාලීන සහ කෙටි කාලීන ණය පහසුකම් මගින් සහාය දීම ;

(ඉ) ශිල්පීන් පුහුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඊ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම සහ ඒ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට උපයෝගී කර ගන්නා අමු ද්‍රව්‍යවල තත්ත්වය හා නිමි භාණ්ඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම ;

(උ) ශිල්පීය ද්‍රව්‍ය සහ ශිල්පීය නිෂ්පාදන ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික ආයතන, සංවිධාන සහ අනුයෝජිත ආයතන සමග සහයෝග යෙන් ක්‍රියා කිරීම ;

(ඌ) හස්ත කර්මාන්ත භාණ්ඩ දර්ශනයට තැබීම සහ විකිණීම සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සාප්පු සහ ප්‍රදර්ශනාගාර නඩත්තු කිරීම හා ඒ දර්ශනයට තැබීම්, ප්‍රදර්ශනය කිරීම් සහ විකිණීම් පැවැත්වීම හා ඒ විකිණීම්වලට ආනුෂංගික සියලු දේ කිරීම ;

(එ) හස්ත කර්මාන්ත භාණ්ඩ ශ්‍රී ලංකාවේ සහ විදේශවල විකිණීම සහ ඒවා අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) මණ්ඩලයේ වැඩ කරගෙන යාම පිණිස අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ඔ) මණ්ඩලය විසින් සේවයට බඳවාගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභසාධක හා විනෝදවීමේ පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් සමාන ඉඩකඩ සැලසීම ;

(ඕ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඛ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, ඇරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම්, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ග) මණ්ඩලය විසින් සපයන ලද යම් සේවාවන් හෝ පහසුකම් සඳහා ගාස්තු අය කිරීම ; සහ

(ච) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට ආනුෂංගික වන්නා වූ හෝ අනුයායි වන්නා වූ සියලු ක්‍රියා සහ දේවල් කිරීම

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය විය යුතු ය.

46. (1) මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට කළ හැකි අතර ඒ විධාන මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

(2) මණ්ඩලයේ දේපළ, කටයුතු සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන තොරතුරු තමා වෙත සපයන සේ අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට ලියවිල්ලකින් වූ විධාන කළ හැකි අතර, එවැනි සෑම විධානයක් ම මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

47. සභාපතිවරයා විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, මණ්ඩලයේ බලතල, කාර්ය හෝ කර්තව්‍යවලින් කිසිවක් ලියවිල්ලකින් මණ්ඩලයේ යම් සේවා නියුක්තයකුට පවරනු ලැබිය හැකි ය. සභාපතිවරයා විසින් සේවා නියුක්තයන්ට බලතල පැවරීම.

48. මේ කොටස ක්‍රියාත්මකවීමෙන් පසු හැකි පහසු ඉක්මණින් සහ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක වන සේ, අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන වර්ධන දෙපාර්තමේන්තුවේ සන්තකයෙහි හා පාලනයෙහි ඇති (මුදල් ද ඇතුළුව) සියලුම නිශ්චල සහ චංචල දේපළ සහ (මෙහි මින් මතු "අදාළ අංශ" යනුවෙන් හඳුන්වනු ලබන) මෙහි උපලේඛනයේ සඳහන් කරනු ලබන කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අංශවලට අයත් වන කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සන්තකයෙහි හා පාලනයෙහි ඇති (මුදල් ද ඇතුළුව) සියලුම නිශ්චල හා චංචල දේපළ, අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන වර්ධන දෙපාර්තමේන්තුවේ හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශවලට අයත් එම දෙපාර්තමේන්තුවේ නියමිත දිනට ඉහතින්ම වූ දිනයෙහි පවත්නා වූ සියලුම වත්කම්, බැරකම්, බලතල, අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද ඇතුළුව, මණ්ඩලයට පවරා හා මණ්ඩලය වෙත සතු කර දිය යුතු ය. අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන වර්ධන දෙපාර්තමේන්තුව සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් අදාළ අංශවලට සම්බන්ධව දරන දේපළ මණ්ඩලයට පැවරීම.

49. මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන වර්ධන දෙපාර්තමේන්තුවේ හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඇතැම් රජයේ නිලධරයන් විසින් දීමට නියමිත දැන්වීම.

50. (1) මේ කොටස ක්‍රියාත්මකවීමට පෙරාතුව ම වූ දිනයෙහි අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන වර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශවල හෝ සේවයේ නියුතු ආණ්ඩුවේ සථාන මාරු සහිත සේවාවක රජයේ නිලධරයකු නොවන, සෑම රජයේ නිලධරයකුට සහ යම් නිලධරයකුගේ ධුරයේ කර්තව්‍ය මණ්ඩලය වෙත සතු කරන ලද හෝ මණ්ඩලයට පවරා ගන්නා ලද එවැනි සෑම නිලධරයකුට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ ද විශ්‍රාම වැටුප් සහිත බවට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රකාශ කරන ලද තනතුරක් දරන්නා වූ ද සෑම රජයේ නිලධරයකු ම විසින්, 48 වන වගන්තිය යටතේ නියමය කරන ලද දින සිට මාස තුනක් පසු නොවී, ඒ නියමය කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි—

(අ) රජයේ නිලධරයකු වශයෙන් දරන ධුරයෙහි තවදුරටත් නිරතවීමට සහ එසේ නිරතව සිටිනතාක් කල් ඒ නිලධරයා වශයෙන් මණ්ඩලයට සහ මණ්ඩලය වෙනුවෙන් වැඩ ඉටු කිරීමට ; හෝ

(ආ) විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනට, ඔහු අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇතිව සිටියේ නම්, රජයේ සේවයෙන් විශ්‍රාම ලබා මණ්ඩලයේ සේවානියුක්තයකුවීමට ; හෝ

(ඇ) විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනට, ඔහුට අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇත්තේ නම්, රජයේ සේවයෙන් ඉවත් වී මණ්ඩලයේ සේවානියුක්තයකුවීමට ; හෝ

(ඈ) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායකයකු වේ නම්, මණ්ඩලයේ සේවානියුක්තයකුවීමට රජයේ සේවයෙන් ඉවත්වීමට ; හෝ

(ඉ) රජයේ සේවයෙන් ඉවත්වීමට මෙන්ම මණ්ඩලයේ සේවානියුක්තයකු නොවීමට

අදහස් කරන බවට ලියවිල්ලකින් වූ දැන්වීමක් මණ්ඩලයට දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් අවසානාත්මක විය යුතු ය.

51. 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනතෙහි 31ආ, 31ඇ, 32 සහ 32අ වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 50 වන වගන්තියේ සඳහන් යම් රජයේ නිලධරයකුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

50 වන වගන්තියේ සඳහන් නිලධරයන්ට 1969 අංක 17 දරන පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

52. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, 50 වන වගන්තියේ සඳහන් නිලධරයකු නොවන රජයේ සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ, ඒ නිලධරයා සේවයේ නියුක්ත කර ඇත්තේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

50 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් නොවන්නා වූ රජයේ නිලධරයන් පත් කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට එම උපවගන්තිය යටතේ තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඒ උපවගන්තිය යටතේ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථෝචිත පරිදි, එම නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයෙහි හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලබන නියම හා කොන්දේසි මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය සහ එකී රාජ්‍ය සංස්ථාව විසින්

එකඟවනු ලබන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ කොන්දේසි ඇතුළු නියමයන් සහ කොන්දේසි යටතේ, යට කී අන්දමේ ම කැමැත්ත ඇතිව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්ති යටතේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මණ්ඩලයට කරනු ලබන සේවය ආණ්ඩුවට සේවය කිරීමට ඇතුළත් වී ඇති ගිවිසුම්වල කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවය ලෙස සැලකිය යුතු බව.

53. යම් තැනැත්තකු නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹී ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාල සීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුප් දනටමත් ලබන තැනැත්තන් මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරවීම.

54. ආණ්ඩුවෙන් හෝ යම් පළාත් පාලන ආයතනයකින් හෝ පළාත් පාලන සේවා කොමිසමෙන් හෝ විශ්‍රාම වැටුපක් ලබමින් සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඔහු මණ්ඩලයේ සේවානියුක්තව සිටින කාලසීමාව තුළ ඔහුට ඒ විශ්‍රාම වැටුප නො ගෙවිය යුතු ය.

අර්ථ නිරූපණය.

55. මේ කොටසේ කාර්ය සඳහා—

"විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධරයා" යන්නෙන්—

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති තනතුරක් දරන ; සහ

(ආ) ස්ථාන මාරු කරනු ලැබිය හැකි ආණ්ඩුවේ සේවයකට අයත් නොවන

රජයේ නිලධරයෙක් අදහස් වේ ;

"විශ්‍රාම වැටුප් හිමි සේවය" යන්නෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගණන්ගනු ලැබිය හැකි ආණ්ඩුව යටතේ කරනු ලබන සේවය අදහස් වේ.

මණ්ඩලයේ විධානයන් මත හෝ මේ කොටස යටතේ කරන ලද ක්‍රියාවන් සඳහා ආරක්ෂාව.

56. (අ) මේ කොටස යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ කොටස යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු, සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, සේවානියුක්තයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

57. මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ ඒ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

58. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

59. මණ්ඩලයට මණ්ඩලයේ ම අරමුදලක් තිබිය යුතු ය. මණ්ඩලයට ලැබෙන සියලුම මුදල් ඒ අරමුදලට බැර කළ යුතු අතර මණ්ඩලය විසින් කරනු ලබන සියලුම ගෙවීම් අරමුදලෙන් ගෙවිය යුතු ය.

මණ්ඩලයේ අරමුදල.

60. (1) පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට ප්‍රදානය කරනු ලබන මුදල් ප්‍රමාණයක් මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය විය යුතු ය.

මණ්ඩලයේ ප්‍රාග්ධනය.

(2) මණ්ඩලයේ ප්‍රාග්ධනය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර ඒ මුදල් ප්‍රමාණය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම සහ කොන්දේසි මත ප්‍රදානයක් වශයෙන් හෝ ණයක් වශයෙන් මණ්ඩලයට ගෙවිය යුතු ය; නැතහොත් මණ්ඩලයට ලබා ගත හැකි විය යුතු ය.

(3) 48 වන වගන්තිය යටතේ මණ්ඩලය වෙත පවරන ලද සියලුම නිශ්චල සහ චංචල දේපළවල සහ සියලු වත්කම්වල හා බැරකම්වල ශුද්ධ වටිනාකම නැතහොත් ඒ නිශ්චල සහ චංචල දේපළවල සහ වත්කම්වල හා බැරකම්වල ශුද්ධ වටිනාකමෙන් කිසියම් කොටසක්, (2) වන උපවගන්තියෙහි සඳහන් මණ්ඩලයේ ප්‍රාග්ධනයෙහි වැඩිවීමේ ප්‍රමාණයෙහි කොටසක් වන්නේ යයි සලකනු ලැබිය හැකි ය.

61. කාර්ය මණ්ඩලයේ වැටුප් සහ වෙනත් පඩිනඩිවල වියදම් පියවීමට සහ 48 වන වගන්තියේ සඳහන් "අදාල අංශවලට" අයත් නිශ්චල දේපළ නඩත්තු කිරීමේ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් මණ්ඩලයට වාර්ෂිකව ප්‍රදානයක් දෙනු ලැබිය හැකි ය.

මණ්ඩලයට දෙනු ලබන වාර්ෂික ප්‍රදානය.

62. මේ පනත යටතේ, මණ්ඩලයේ බැඳීම් ඉටු කිරීම සඳහා හෝ මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය මුදල් අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින්, මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව, තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය :

ණයට ගැනීමේ බලතල.

එසේ වුව ද, මේ වගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණය සම්බන්ධයෙන් ගෙවීමට තිබෙන මුදල්වල එකතුව කිසිම අවස්ථාවක අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

මණ්ඩලයේ අරමුදල් ආයෝජනය කිරීම.

63. මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාමේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ මණ්ඩලයේ යම් අරමුදල් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකහත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමතය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ මුදල් වර්ෂය සහ මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම.

64. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ මණ්ඩලයේ වෙනත් සියළුම කටයුතු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මුදල් වර්ෂයක් තුළ මණ්ඩලය විසින් කර ගෙන යාමට අදහස් කරන වැඩ නියමාවලිය අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත යැවිය යුතු බව.

65. ඊළඟ මුදල් වර්ෂය තුළ මණ්ඩලය විසින් කරගෙන යාමට භාරගනු ලබන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වූ වැඩ නියමාවලිය අමාත්‍යවරයාගේ අනුමතය සඳහා සෑම මුදල් වර්ෂයකම නොවැම්බර් පළමු වැනි දිනට පෙර මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර වැඩ නියමාවලිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානයන්ට මණ්ඩලය සැලකිල්ල දක්විය යුතුය.

නියෝග.

66. (1) මේ කොටස මගින් නියම කරනු ලැබීමට අවශ්‍ය කරන ලද්දා වූ කාරණා සම්බන්ධයෙන් හෝ මේ කොටස මගින් නියෝග සෑදීමට අවශ්‍ය කරන ලද්දා වූ හෝ බලය දෙන ලද්දා වූ කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

67. මණ්ඩලයට විරුද්ධව යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක් මණ්ඩලයේ සුහසිද්ධිය ගැන සැලකිල්ල යොමු කිරීමේ දී එය සාධාරණ යයි මණ්ඩලය විසින් සල කනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් ප්‍රමාණවත් වන්නේ යයි සලකනු ලබන මුදලක් හෝ වෙනත් වන්දියක් ගෙවීමෙන් ඒ හිමිකම්පෑම හෝ ඉල්ලීම මණ්ඩලය විසින් සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

හිමිකම් පෑම සමථයකට පත් කිරීමට මණ්ඩලයට ඇති බලය.

68. යම් සමාගමක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක කර්තව්‍ය වලට සම්බන්ධවන යම් ලිඛිත නීතියක හෝ සාධන පත්‍රයක පට හැනිව කුමක් සඳහන්ව ඇත ද, මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීමට ඉතා වැදගත් වන සියලු ගිවිසුම්වලට, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසින් මණ් ඩලය සමඟ එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹීමට සමාගම් ආදියට ඇති බලය.

69. (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට ඉඩම් විෂයය භාර අමාත්‍ය වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් මණ්ඩලයේ නිශ්චිත කාර්යයන් සඳහා යම් නිශ්චල රජයේ දේපළක සන්තකය සහ පාවිච්චිය මණ්ඩලය වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය හැකි ය.

චංචල සහ නිශ්චල යන උභය අංශයේ රජයේ දේපළ මණ්ඩලයට ලබා දිය යුතු බව.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියම යක් මගින්, මණ්ඩලයේ නිශ්චිත කාර්යයන් සඳහා යම් චංචල රජයේ දේපළක සන්තකය සහ පාවිච්චිය මණ්ඩලය වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන්නා වූ කිසිම නියම යක්, ඒ දේපළ පිළිබඳ පාලනය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

70. (1) මණ්ඩලයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යෝජිත අත්කර ගැනීම අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි අතර, එම ඉඩම අවශ්‍ය වන්නා වූ කාර්යය මහජන කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය. ඉන් ඉක්බිතිව ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් එම නිශ්චල දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය සඳහා ඉඩම් අත්කර ගැනීම.

(2) මණ්ඩලය විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

## IV වන කොටස

ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

71. (1) (මින් මතු මේ කොටසෙහි "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික මෝස්තර මධ්‍යස්ථානයක් පිහිටුවිනු ලැබිය යුතු ය.

(2) මධ්‍යස්ථානය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද එකී සංස්ථා නාමයෙන් මධ්‍යස්ථානය විසින් නඩු පැවරීම ද මධ්‍යස්ථානයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සංයුතිය.

72. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ මණ්ඩලයක් මගින් මධ්‍යස්ථානය කළමනාකරණය කරනු ලැබිය යුතු ය:—

(i) අමාත්‍යවරයාට පෙනීයන ආකාරයට පර්යේෂණ, නිෂ්පාදන සංවර්ධන හා ශිල්ප පිළිබඳ මෝස්තර සකස් කිරීමේ ක්ෂේත්‍රයේ පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇති සහ ඒවා පිළිබඳ හැකියාවක් දක්වා ඇති තැනැත්තන් අතුරින් සභාපතිවරයෙක් සහ තැනැත්තන් හතර දෙනෙක් ;

(ii) ජාතික ශිල්ප සභාවේ සභාපතිවරයා ;

(iii) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සභාපතිවරයා ;

(iv) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක් ; සහ

(v) අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන ඒ මණ්ඩලයේ නියෝජිතයෙක්.

සාමාජිකත්වයට නුසුදුසුවීම.

73. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නම් හෝ මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් එළඹියාවූ යම් ගිවිසුමක් යටතේ කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් අයිතිවාසිකමක් හෝ යම් ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තමාගේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අහිතකර ලෙස බලපෑ හැකි එවැනි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීම සඳහා හෝ සුදුස්සකු නොවිය යුතු ය.

සාමාජිකයා මණ්ඩලයට සම්බන්ධතාවය එළිදරව් කළ යුතු බව.

74. මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලැබීමට යෝජනා කර ඇති යම් ව්‍යාපාරික කටයුත්තක් පිළිබඳව සෘජුව ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින්, ඒ ව්‍යාපාරික කටයුත්ත ගැන සාකච්ඡා කරනු ලබන මණ්ඩලයේ රැස්වීමේ දී, ඒ සම්බන්ධතාවයේ ස්වභාවය එළිදරව් කළ යුතු ය. ඒ එළිදරව් කිරීම මණ්ඩලයේ වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ව්‍යාපාරික කටයුත්තට අදාළව මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් විචාරණයක දී හෝ තීරණයකට එළඹීමේ දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු අතර, ඒ විචාරණය පැවැත්වෙන අතරතුර හෝ ඒ තීරණයට එළඹෙන අතරතුර ඒ සාමාජිකයා ඒ රැස්වීම්වලින් ඉවත්ව යා යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් සහ ගණපූරණය.

75. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් සාමාජිකයන්ගෙන් කෙනෙක් ඒ රැස්වීමෙහි මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙක් විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම පිළිබඳව කාර්ය පරිපාටිය නියමිත පරිදි විය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් ඇති වුවහොත් ඒ රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීමෙහි දෝෂයක් හේතුකොට ගෙන ක්‍රියා අවලංගු නොවන බව.

76. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

77. (1) සෑම සාමාජිකයකු ම, තමා මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු මියගිය හෝ ධුරය හැරගිය හෝ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක හෝ, අමාත්‍යවරයා විසින් 72 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත්කරනු ලැබූ ආකාරයටම වෙනත් තැනැත්තකු

පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නො ගෙවී ඉතිරිව ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්ය යම් කාලයක් තුළ ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නො හැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 72 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරය වම වෙනත් තැනැත්තකු ඒ කාලය තුළ ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන් ඉවත් කිරීම.

78. (1) 72 වන වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරතහොත් ඒ සඳහා හේතු සඳහන් නොකර ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම.

79. ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ යම් සාමාජිකයකුට ස්වකීය ධුර යෙන් ඉල්ලා අස්විය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

80. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්විය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් මධ්‍යස්ථා නයේ අරමුදලින් සියලුම සාමාජිකයන්ට හෝ ඔවුන් අතුරින් යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

මධ්‍යස්ථානයේ මුද්‍රාව.

81. (1) මධ්‍යස්ථානයේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) මධ්‍යස්ථානයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මධ්‍යස්ථානයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛන යට තම අත්සන් තැබිය යුතු ය.

මධ්‍යස්ථානයේ බලතල සහ කර්තව්‍ය.

82. මධ්‍යස්ථානයේ බලතල හා කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) කුඩා කර්මාන්ත සඳහා මෝස්තර කිරීම භාර ගැනීම, හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා හා ඒ භාණ්ඩ පිළිබඳ මෝස්තර කිරීම සඳහා උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම භාර

ගැනීම සහ ආනයනය කරනු ලබන අමු ද්‍රව්‍ය වෙනුවට දේශීය අමු ද්‍රව්‍ය උපයෝගී කර ගැනීම ආදේශ කිරීම ගැන සලකා බැලීම ;

(ආ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශවල වෙළෙඳ පොළ වල සංවර්ධනය සහ ඒවා සඳහා වෙනත් රටවල ඉල්ලුම පිළිබඳ දැනීම ලබා ගැනීම ;

(ඇ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නවීන හා වඩාත් කාර්යක්ෂම ක්‍රම යොදා ගැනීම ;

(ඈ) හස්ත කර්මාන්ත භාණ්ඩ වඩා සකසුරුවම් සහිතව හා කාර්යක්ෂම ලෙස නිෂ්පාදනය කිරීම අරමුණු කොට ගෙන යාන්ත්‍රීකරණය ඇති කිරීම ගැන සලකා බැලීම ;

(ඉ) හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි ලා උපයෝගී කරගනු ලබන ක්‍රම සහ අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම ද සාමාන්‍යයෙන් හස්ත කර්මාන්ත භාණ්ඩ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදනය කිරීම ද සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට සහ ශිල්පීන්ට උපදෙස් දීම හා සහාය වීම ;

(ඊ) ජාතික ශිල්ප සභාවේ, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ, ශිල්ප සභාවල සහ වෙනත් මණ්ඩලවල හෝ පුද්ගලයන්ගේ ඉල්ලීම් මත හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය සඳහා උපයෝගී කරගන්නා ද්‍රව්‍ය සම්බන්ධ යෙන් පරීක්ෂණ කිරීම සහ ඒ ද්‍රව්‍යවල තත්ත්වය හා ප්‍රමිතිය සම්බන්ධයෙන් නියම කරන ලද සහතික නිකුත් කිරීම ;

(උ) ජාතික ශිල්ප සභාවට, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩල යට, ශිල්ප සභාවලට සහ ශිල්පීන්ට එලදායි වන්නා වූ කරුණු, ක්‍රම, මෝස්තර සහ වෙළෙඳ පොළ ප්‍රවනතා ගැන තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම ;

(ඌ) මධ්‍යස්ථානය විසින් ඉටු කරන ලද සේවාවන් සඳහා ගාස්තු පැනවීම හා එකතු කිරීම ;

(එ) රසායනාගාර, වැඩපොළවල් සහ වෙනත් ආයතන පවත්වා ගෙන යාම ;

(ඒ) මධ්‍යස්ථානයේ පරමාර්ථවලට මුළුමනින්ම හෝ අඩ වශ යෙන් සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල ආයතන සමග ආණ්ඩුවේ අනුමතය ඇතිව එකඟවීම්වලට එළඹීම ; සහ

(ඔ) මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කර්තව්‍ය ඉටු කිරීමට ආනුෂංගික හෝ අනුයායී වන්නා වූ ක්‍රියා ඉටු කිරීම.

83. (1) මධ්‍යස්ථානයට මධ්‍යස්ථානයේ අරමුදලක් තිබිය යුතු ය. මධ්‍යස්ථානයේ අරමුදලට— මධ්‍යස්ථානයේ අරමුදල.

(අ) මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මධ්‍යස්ථානයට පවරනු ලබන සියලු මුදල් ; සහ

(ඇ) යම් රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් මධ්‍යස්ථානයට නීතියට අනුකූලව පවරනු ලබන සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මධ්‍යස්ථානය විසින් දරන ලද යම් වියදම් ගෙවීමට අවශ්‍ය සියලු මුදල් මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

84. (1) මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මධ්‍යස්ථානය විසින් මධ්‍යස්ථානයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ මධ්‍යස්ථානයේ වෙනත් සියලු කටයුතු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මධ්‍යස්ථානයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය.

85. (1) මධ්‍යස්ථානයේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන නිලධරයන් හා සේවකයන් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව—

(අ) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) කාර්ය මණ්ඩලයේ වැටුප් හෝ වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ සේවා කොන්දේසි නිර්ණය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය සඳහා අර්ථ සාධක අරමුදලක් සහ ක්‍රම පිහිටුවීම ද විධිමත් කිරීම ද ඒ අරමුදලට හෝ ක්‍රමවලට දායක මුදල් ගෙවීම ද

මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු ම කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) රජයේ සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මධ්‍යස්ථානය යටතේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ එකඟවීමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් වූ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලබන නියම හා කොන්දේසි මත සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා ඒ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ රාජ්‍ය සංස්ථාවේ කැමැත්ත ඇතිව මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් වූ අයිතිවාසිකම් වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව මණ්ඩලය සහ එකී රාජ්‍ය

සංස්ථාව විසින් එකඟවනු ලබන නියම සහ කොන්දේසි මත ඒ නිලධරයා හෝ සේවකයා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව ස්ථිර ලෙස පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(10) යම් තැනැත්තකු (8) වන උපවගන්තිය සහ (9) වන උප වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

නියෝග.

86. (1) මේ කොටස මගින් නියම කරනු ලැබීමට අවශ්‍ය කරන ලද්දා වූ කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට අවශ්‍ය කරන ලද්දා වූ හෝ බලය දෙන ලද්දා වූ කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කළ හැකි පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝග යක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය. නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

මණ්ඩලය විසින් සාදන ලද රීති.

87. (1) මේ කොටස මගින් රීති සෑදීමට බලය දී ඇත්තේ නැත හොත් නියම කර ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

මේ කොටස යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ කරන ලද ක්‍රියාවන් සඳහා ආරක්ෂාව.

88. (අ) මේ කොටස යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ කොටස යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ මධ්‍යස්ථානයේ යම් සාමාජිකයකු හෝ සේවානියුක්තයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට හෝ සේවා නියුක්තයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

**හිමිකම් පෑම් සමථයට පත් කිරීමට මණ්ඩලයට ඇති බලය.**

**89.** මණ්ඩලයට විරුද්ධව යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් හිමිකම් පෑමක් හෝ ඉල්ලීමක් මධ්‍යස්ථානයේ සුභසිද්ධිය ගැන සැලකිල්ල යොමු කිරීමේ දී එය සාධාරණ යයි මණ්ඩලය විසින් සල කනු ලබන අවස්ථාවක අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් ප්‍රමාණවත් වන්නේ යයි සලකනු ලබන මුදලක් හෝ වෙනත් වන්දියක් ගෙවීමෙන් ඒ හිමිකම් පෑම හෝ ඉල්ලීම මණ්ඩලය විසින් සමථයට පත් කරනු ලැබිය හැකි ය.

**මධ්‍යස්ථානය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත් කර ගැනීම.**

**90.** (1) මධ්‍යස්ථානයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි අතර එම ඉඩම අවශ්‍ය වන්නා වූ කාර්යය මහජන කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය. ඉන් ඉක්බිතිව ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් එම නිශ්චල දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.

(2) මධ්‍යස්ථානය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් මධ්‍යස්ථානය විසින් ගෙවනු ලැබිය යුතු ය.

**රජයේ චංචල හා නිශ්චල දේපළ මධ්‍යස්ථානයට ලබා ගැනීමට හැලැස් විය හැකි බව.**

**91.** (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් මධ්‍යස්ථානයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල රජයේ දේපළක සන්තකය සහ පාවිච්චිය, මධ්‍යස්ථානය වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, මධ්‍යස්ථානයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් චංචල රජයේ දේපළක (මුදල් ඇතුළුව) සන්තකය සහ පාවිච්චිය මධ්‍යස්ථානය වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ රජයේ යම් චංචල දේපළකට බලපාන කිසිම නියමයක්, ඒ දේපළ පිළිබඳ පාලනය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

## උපලේඛනය

[48 වන වගන්තිය]

මණ්ඩලයට පවරා හා මණ්ඩලය වෙත සතු කර දෙනු ලබන කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අංශ.

අරුමෝසම් භාණ්ඩ
සෙල්ලම් භාණ්ඩ
වේවැල් භාණ්ඩ
උණ බට භාණ්ඩ
ඉරටු භාණ්ඩ
පැදුරු කර්මාන්ත
හණ භාණ්ඩ
වැටකෙයියා භාණ්ඩ
තල්කොළ භාණ්ඩ
ඉඳිකොළ භාණ්ඩ
වෙස් මුහුණු සෑදීමේ කර්මාන්ත
ලී කැටයම් කිරීමේ කර්මාන්ත
පොල්කටු කැටයම් කිරීමේ කර්මාන්ත
රේන්ද ගෙතීමේ කර්මාන්ත
මැහුම් කර්මාන්ත
ග්‍රාමීය මැටි කර්මාන්ත
ලාක්ෂ කර්මාන්ත
බට භාණ්ඩ
පන් භාණ්ඩ
අවන් කර්මාන්ත

සඳහා වූ මධ්‍යස්ථාන.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.